# ජාතික රාජ්‍ය සභාවේ
# 1974 අංක 40 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 නොවැම්බර් මස 6 වන දින]

(ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී)

(1974 නොවැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකාවේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 40 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 නොවැම්බර් මස 6 වන දින]

එල්. ඩී.—ඔ. 14/74

**1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 40 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතෙහි 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— **1969 අංක 7 දරන පනතේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

"අස් කිරීමේ නිවේදනය ඉවත් කර ගැනීම හෝ අත්හිටුවීම.

5. රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් යම් අවස්ථාවක අස් කිරීමේ නිවේදනයක් ඉවත් කර ගැනීම හෝ තමා සුදුසු යයි සලකන කාල සීමාවක් සඳහා එය ක්‍රියාත්මක වීම අත්හිටුවීම හෝ කළ හැකි ය.".

**3.** 1971 අංක 3 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියෙහි "නියම බලධරයා" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.**

'"නියම බලධරයා" යන්නෙන් රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් හෝ ඒ ලේකම් විසින් මේ පනතේ කාර්ය සඳහා නියම බලධරයකු වශයෙන් බලය දෙනු ලැබූ යම් කිසි රාජ්‍ය නිලධරයෙක් හෝ අදහස් වේ; '.

ඒ 09706—19,840(74/08)

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.